www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඕපල්, ජෙනරල් මෝටර්ස් සහ ජර්මානු-ඇමරිකානු සබඳතා

## Opel, General Motors and German-American relations

2009 නොවැම්බර් 14

මෑත දිනවල ජර්මානු සහ ඇමරිකානු ආන්ඩුවල නියෝජිතයෝ දෙරට අතර සබඳතාව ගාම්භීර ලෙස වර්නනා කොට ඇත. නොවැම්බර් 3දා ජර්මානු චාන්සලර් ඇන්ජලා මර්කෙල්ට එක්සත් ජනපද කොංග්‍රසය නැගී සිට අත්පොලසන් දුනි. නොවැම්බර් 9 දා ඇමරිකානු රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් බර්ලිනයේ පැවති බර්ලින තාප්පය බිඳ දැමීමේ 20 වන සංවත්සර සැමරුමට සහභාගි වූවා ය. ජනාධිපති බැරැක් ඔබාමා එයට වීඩියෝ පනිවුඩයක් යැවීය.

එහෙත් යමෙක් නිල සැමරුම්වලට යටින් සෝදිසි කරමින් ආර්ථික හා දේශපාලන සබඳතා විභාග කලහොත් ජර්මානු-ඇමරිකානු සබඳතා මුලුමනින් ම වෙනස් ආලෝකයකින් දිස්වනු ඇත. සීතල යුද්ධය අවසන්ව 20 වසරක් ගතවූ තැන ඕපල් මෝටර් රථ නිෂ්පාදන සමාගම වටා නැගී ඇති අර්බුද මගින් පෙන්නුම් කරන පරිදි වැඩෙන ආතතීන් සහ ගැටුම් දවසේ න්‍යාය පත්‍රයට ඇතුලුව ඇත.

වොෂින්ටනයේ මර්කෙල්ට අත්පොලසන් නැගෙන අතරේ ඊට සැතපුම් 500ක් දුරින් ඩිට්‍රොයිට්හි දී තම පූර්ව පොරොන්දු කඩකල ජෙනරල් මෝටර්ස් (ජීඑම්) අධ්‍යක්ෂවරු එහි ජර්මානු ශාඛාව වන ඕපල් සමාගම මෝටර් රථ කොටස් සැපයුම් කරන මැග්නා සමාගමට විකිනීමට එරෙහිව තීන්දු කලේ ඕපල් තවදුරටත් තමන් යටතේ ම තබාගැනීමේ අටියෙනි.

ජීඑම්හි මත වෙනස් කිරීම මර්කෙල්ගේ දේශපාලන වෘත්තීය ජීවිතයේ දී විශාලතම පරාජය බව විස්තර කිරීමේ දී ජර්මානු මාධ්‍ය එකපයින් ඒකමතික වූහ. මෑත දී පැවති ෆෙඩරල් මැතිවරනයේ මර්කෙල්ගේ උද්ඝෝෂනයේ කේන්ද්‍රීය සංරචකයක් බවට ඕපල් සමාගම මැග්නා වෙත විකිනීම පත්කර ගනිමින් ඇය පුද්ගලිකව ආක්‍රමනශීලී ලෙස එම විකිනීම ඉස්මත්තට දැමුවා ය.

සමාගමේ කොටස්වලින් බහුතරය එක්සත් ජනපද ආන්ඩුව සතුව පවතින තතු තුල ජීඑම්හි තීරනය සියලු ආකාරවලින් දේශපාලනිකව අර්ථභාරී වේ. මෙම තීන්දුව බලාත්මක කල අධ්‍යක්ෂ මන්ඩලය පත්කරන ලද්දේ ඔබාමා පරිපාලනය විසිනි.

තීන්දුව කල් තබා ම ගැනී පැවතුන ද මර්කෙල්ට ඒ පිලිබඳව දන්වන ලද්දේ ඇය ඔබාමා මුනගැසීමෙන් හා කොංග්‍රසය ඉදිරියේ පෙනී සිටීමෙන් පසුව පමනි. ඉන් පසුව කියන ලද්දේ ඔබාමා එම තීරනය ගැන දැන නො සිටි බවයි. එහෙත් තීන්දුවේ පවතින පුපුරනසුලු විදෙස් පිලිවෙත් ගම්‍යයන් සම්බන්ධව සලකන කල එම කියාපෑම විශ්වාස කල නො හැක.

ජර්මානු ආන්ඩුවේ නියෝජිතයෝ තම අප්‍රසාදය සැඟවීමට කිසිවක් නො කල තරම් ය. තම "ගැඹුරු කනගාටුව" පිලිබඳව මර්කෙල් චාරිත්‍රානුකූල රාජ්‍යතාන්ත්‍රික සීමාව තුල කතා කරද්දී ඇයගේ ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ (සීඩීයූ) හෙස් ප්‍රාන්ත අගමැති රෝලන්ඩ් කෝච් සිය "කෝපය" පිට කලේ ය. උතුරු රයින් වෙස්ට්පාලියාහි ප්‍රාන්ත අගමැති (සීඩීයූවේ ම) ජුර්ගන් රූට්ගර්ස් කියා සිටියේ ජීඑම්හි හැසිරීම "ටර්බයින-ධනවාදයේ අප්‍රසන්න මුහුනත" හෙලිදරවු කර ඇති බවයි.

ඕපල්-මැග්නා ව්‍යාපෘතියට සිය සහයෝගය දැක්වීමට හේතුව ලෙස මර්කෙල් මවා පා තිබුනේ ජර්මනියේ ඕපල් කර්මාන්තශාලාවල රැකියා පිලිබඳ සැලකිල්ල බවයි. එහෙත් එය බොහෝකොට මැතිවරන ප්‍රචාරයක් පමනි. ඕපල් සමාගම මැග්නා මගින් අත්පත් කරගැනීම ජීඑම්හි යුරෝපා මෙහෙයුම්වල රැකියා 50,000න් 11,000ක් පමන බිල්ලට ගැනීමට නියමිතව තිබුනි.

යථාර්ථයේ දී ඕපල් වටා ගොඩනැගුනු අර්බුදය ධාවනය කරවන ලද්දේ වෙලඳපොලවල් සඳහා අරගලය සහ භූ-දේශපාලනික අවශ්‍යතා ය. ස්වාධීන නව ඕපල් සමාගමක ඉස්මතු වීම ඇමරිකානු මෝටර් රථ කර්මාන්තයට යුරෝපා වෙලඳපොලේ වැදගත් ශාඛාවක් අහිමි කල හැකිව තිබිනි. ඒ අතර ම මැග්නාහි ගනුදෙනුව ජර්මානු මෝටර් රථ කර්මාන්තයට රුසියානු වෙලඳපොල කරා පාලමක් තනා දිය හැකිව තිබිනි.

ඕපල් සමාගම මිලට ගැනීමට මැග්නා සමාගම යත්න දැරුවේ හිටපු ආර්ථික ඇමතිවරයෙකු හා

රුසියානු අගමැති ව්ලැඩිමීර් පුටින්ගේ සමීප සහකරුවකු වන ජර්මන් ග්‍රෙෆ් ප්‍රධානත්වය දරන රුසියානු ස්බර්බෑන්ක් සමාගම සමග හවුලේ ය. එමගින් අවසංවර්ධිත රුසියානු මෝටර් රථ කර්මාන්තයට දැවෙන අවශ්‍යතාවක් වන තාක්ෂනික ඥානය ලබාගැනීම කරා අතගසා ගත හැකිව තිබුනි. එයට හිලවු ලෙස ඕපල් සමාගමට හා රුසෙල්හයිම්හි එහි තාක්ෂනික මධ්‍යස්ථානයට රුසියානු සහ ඒ හරහා ආසියානු වෙළඳපොලට මාවත පාදා ගත හැකි වනු ඇත. මෙම සැලැස්මට සහයෝගය දැක්වූ රුසියානු ආන්ඩුව එහි බිඳවැටීම ගැන නො මනාපයෙන් ප්‍රතිචාර දැක්වී ය.

රුසියානු කාර් වෙළඳපොල සැලකෙන්නේ ලෝකයේ හොඳ ම වෙළඳපොලවලින් එකක් ලෙස යි. ලෝක ආර්ථිකය බිඳ වැටීමට පෙර 2007 වර්ෂය තුල ඩොලර් බිලියන 45ක සමස්ත වටිනාකමින් යුත් කාර් මිලියන 2.5ක් රුසියාව තුල විකුනනු ලැබ තිබිනි. මෙයින් අඩකටත් වැඩි ප්‍රමානයක් ආනයනය කරනු ලැබීය. තවත් පහෙන් පංගුවක් විදේශ බලපත්‍ර යටතේ රුසියාව තුල නිෂ්පාදනය කරන ලදී.

නුදුරු අනාගතයේ දී විකිනීම් දෙගුන වනු ඇතැයි විශේෂඥයෝ ඇස්තමේන්තු කරති. දැනට වැඩි වාසි තිබෙන්නේ ඇමරිකානු, ජපාන සහ කොරියානු මාදිලිවලට යි. රුසියාවේ ඇව්ටොවාස් සමග සහකාරීත්වය දරන ජීඑම්හි ෂෙව්රොලෙට් මාදිලිය වෙළඳපොලින් සියයට 8ක් සමගින් මුල් තැනේ පසුවේ. ශක්තිමත් ම ජර්මානු සමාගම වන ෆොක්ස්වැගන් 14 ස්ථානයේ ගාටමින් යයි.

මැග්නා ගනුදෙනුව සාර්ථක වූයේනම් රුසියාව තුල ෂෙව්රොලෙට්හි ප්‍රධානතම තරගකරුවා වන්නේ ඕපල් ය. රුසියානු වෙළඳපොල සඳහා වර්ධනය කරන ලද ඕපල් මාදිලියක් නිශ්නි නොව්ගොරොද්හි පිහිටා ඇති වොල්ගාහි ගෑස් නමැති මෝටර් රථ නිෂ්පාදන සමාගමේ කර්මාන්ත ශාලා තුල නිමැවීමට නියමිතව තිබිනි. දැනට එහි නිෂ්පාදනය නතර කොට ඇති අතර ගෑස්හි රැකියා 118,000න් අඩක් පමන කපාදැමීමට නියමිත ය. ඊට අමතරව ලාඩා රථය නිෂ්පාදනය කරන අර්බුද ග්‍රස්ථ හා කම්කරුවන් 102,000ක් සේවයේ යොදවා ඇති ඇව්ටොවාස් සමාගම නව තාක්ෂනයේ අවශ්‍යතාවෙන් දැඩි ලෙස පෙලෙමින් සිටී.

මැග්නා ගනුදෙනුව අත්හැර දැමීමට ජීඑම් ගත් තීන්දුවට බලපෑ එක් ප්‍රධාන සාධකයක් වන්නේ රුසියාවට තාක්ෂනය යැවීමට තිබූ සැලැස්ම යි. ජීඑම්හි ගෝලීය නිෂ්පාදන සංවර්ධන උප සභාපති බොබ් ලුට්ස්, ප්‍රධාන විධායක නිලධාරී ෆ්‍රිට්ස් හෙන්ඩර්සන්ට එරෙහිව ජය ගත්තේ ය. ඕපල් සමාගම විකුනා දමා එහි ප්‍රතිව්‍යුහගත කිරීමේ වියදම ඉතිරි කරගැනීමට හෙන්ඩර්සන්ට අවශ්‍ය තිබෙද්දී ලුට්ස් තර්ක කලේ එලෙස විකුනා දැමීම ජීඑම්ට රුසියාව තුල තරගකරුවෙක් නිර්මානය කොට යුරෝපය තුල ජීඑම්හි තාක්ෂනික වාසිය මෙන් ම වෙළඳපොල ද දුර්වල කරනු ඇති බවයි.

අලෙවිය පිලිබඳ තර්ක කිරීම් පිටුපසින් වෙළඳපොල සහ තාක්ෂනය විශාල භූ-මූලෝපායික ප්‍රශ්න ලෙස පවතී. රුසියාව සමග ශක්තිමත් සබඳතා වර්ධනය කරගැනීම හරහා එක්සත් ජනපදය මත සිය ආර්ථික හා මිලිටරිමය රඳා පැවැත්ම අඩු කර ගැනීමට ජර්මනිය දීර්ඝ කාලීනව උත්සාහ දරා තිබේ. මෙය වොෂින්ටනයේ මෙන් ම අනෙකුත් යුරෝපීය අගනගර තුලත් ප්‍රතිරෝධයක් අවුලුවා තිබේ. විශේෂයෙන් ම නැගෙනහිර යුරෝපීය රාජ්‍ය තම අවශ්‍යතා බර්ලින්-මොස්කව් අවශ්‍යතා වෙනුවෙන් කැපකිරීමට සිදුවේ යයි සැකසංකා පලකරති. ජර්මනිය යුරෝපා සංගමයේ වියදමින් ඒකපාර්ශ්වික ලෙස මහා බල අවශ්‍යතා ලුහුබඳී යයි පැරිසියේ සහ ලන්ඩනයේ බියක් පවතී.

වසර අටකට පෙර මෙම ප්‍රශ්න මත විවෘත ගැටුමක් ඇවිලිනි. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (එස්පීඩී) ගෙහාඩ් ශ්‍රෑඩර්ගේ ජර්මානු ආන්ඩුව ඉරාක යුද්ධයට විරුද්ධත්වය පලකල විට ආරක්ෂක ලේකම් ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ්ගේ වචනවලට අනුව වොෂින්ටනය "පැරනි යුරෝපයට" එරෙහිව "නව යුරෝපය" බලමුලුගැන්වූයේ යුරෝපීය ඒකාග්‍රකරන සන්තතිය පැකිලවමිනි.

ප්‍රධාන ජර්මානු බලශක්ති සංසදවල සහයෝගය ලද, බොහෝදුරට රුසියානු ජනාධිපති පුටින් මත රඳා සිටි ශ්‍රෑඩර්ගේ විදේශ ප්‍රතිපත්තිය ජර්මනිය තුල මත් විරුද්ධත්වයට මුහුන පෑවේ ය. විශාල වසයෙන් රුසියාව මත රඳා සිටීම අන්තරායකාරී බව නිගමනය කල ජර්මානු ප්‍රභූ තන්ත්‍රයේ නායක කව එක්සත් ජනපදය සමග සන්ධානයේ විශිෂ්ටත්වය මත අවධාරනය කලහ. මෙම ප්‍රශ්නයේ දී ශ්‍රෑඩර්ගේ වැඩි වුනු හුදකලාභාවය ඔහුගේ ආන්ඩුකාලය නියමිත කලට පෙර අවසන් වීමට හේතු විය.

ඕපල් පිලිබඳ ප්‍රශ්නයේ දී ද ඒ හා සමානව අන්තර්-යුරෝපීය සහ ජර්මනිය ඇතුලත ආතතීන් ගසාකෑමට ඇමරිකානු පාර්ශවය සමත්ව සිටී. ජීඑම්හි බ්‍රිතාන්‍ය ශාඛාව වන වොක්ෂෝල් සමාගමේ කර්මාන්තශාලා පිහිටා ඇති ස්පාඤ්ඤය, බෙල්ජියම හා බ්‍රිතාන්‍යය තුල මැග්නා සමාගමට එරෙහි ජීඑම් තීරනය සාදරයෙන් පිලිගැනුනි. එම රටවල් තුල හෙලාදැකීමට ලක්වුනු ජර්මානු නිෂ්පාදන කම්හල්වලට වඩා කැමති වෙමින් ජර්මානු ආන්ඩුව මැග්නා ගනුදෙනුව ඒක පාර්ශවීයව හා අනුකම්පා විරහිතව ඉදිරියට දමා තිබිනි.

මැග්නා නමැති එක් සමාගමට පමනක් යුරෝ බිලියන 4.5ක ප්‍රතිසංවර්ධන ආධාර මුදලක් පොරොන්දු නො වුනු බවට සහතිකයක් ජර්මානු ආන්ඩුවෙන් ඉල්ලා සිටි යුරෝපා සංගම් තරග කොමසාරිස් නෙලී ක්‍රොස් වෙත ඔවුන් හැරුනි. මෙය ඕපල් සමාගම ජීඑම් සන්තකයේ ම තබා ගනිමින් ජර්මානු රාජ්‍ය අරමුදල්වලට ප්‍රවිෂ්ට මාර්ගයක අපේක්ෂාව ඩිට්‍රොයිට් තුල නිර්මානය කලේ ය.

ජර්මනිය තුල දී මැග්නා ගනුදෙනුවට එරෙහි තීරනය හුදෙක් එක්සත් ජනපද හිතවාදී දේශපාලන කව මගින් පමනක් නොව ඕපල්හි කලමනාකරන පිලිවෙත්වලට ජර්මානු ආන්ඩුවේ මැදිහත් වීම "නිදහස් වෙලඳපොල" ආර්ථිකයට එරෙහි අපරාධයක් ලෙස සලකන මහ ව්‍යාපාරික කොටස් විසින් ද සාදරයෙන් පිලිගැනීමට ලක් වුනි.

ඒ අනුව ද *ෆ්‍රෑන්ක්ෆර්ටර් අල්ගෙමයින්* මෙසේ අදහස් දැක්වීය: "උදවු කරන්නාගේ සහලක්ෂනය මගින් පීඩාවට පත්ව ඇති ජර්මානු දේශපාලකයෝ ඕපල්හි දී රතු ඉරක් පැන ඇත. මෝටර් රථ නිෂ්පාදනයේ තරගය නවතා දමා ඇති ඔවුහු ජර්මනිය වඩාත් පැහැරගැනීමට විවෘත කර ඇත." ඩී වෙල්ට් මෙසේ කීය: "ඕපල් කටයුත්තේ උදරාබාධය දේශපාලකයන්ට එක් පාඩමක් ඉගැන්විය යුතු ය. එනම් මින් මතු කලමනාකරන තීරන කර්මාන්තයේ යෙදෙන වගකිව යුත්තන්ට ඉතිරි කර තබන්න." එම පුවත්පත් දෙකම ඩොලර් බිලියන සිය ගනනින් බැංකුවලට ඇපතැබීමට සහයෝගය දීම සහ සංගත තීරන ගැනීමේ ක්‍රියාවලියෙන් පසෙකට වී සිටීමේ ප්‍රවිෂ්ටය පිලිබඳව ජනාධිපති ඔබාමාව උත්කර්ෂයට නැංවීය.

ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ මහ ව්‍යාපාරික අංශය ද මර්කෙල්ගේ නව ආන්ඩුවේ කනිෂ්ට හවුල්කරුවා වන නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ද ජීඑම් තීරනය මගින් ශක්තිමත් වූ ලෙස හඟිති. මර්කෙල්ගේ මෑත ආන්ඩුවේ නිවේදනයේ දී ඉතා ම අත්‍යවශ්‍ය ප්‍රශ්නවල දී ඇය ඔවුන් පිටුපසින් වැනි වැනී ගියා ය. බදු අඩු කිරීමට, (හාම්පුතුන් හා සේවකයන් විසින් වියදම් දරන) සමාජ රක්ෂන පද්ධතිය අත්හැර දැමීමට හා පන්ති දෙකේ සෞඛ්‍ය ක්‍රමයක් වර්ධනය කිරීමට ඇය ආන්ඩුව කැප කලා ය.

එක්සත් ජනපදය සමග ගැටුම මෙමගින් නිවී නො යයි. ඊට විපරීතව ජර්මානු සහ ඇමරිකානු ආර්ථික අවශ්‍යතා හුදෙක් ඕපල් සමාගම යන කාරනාව මත පමනක් නොව විනිමය සහ මූල්‍ය ප්‍රතිපත්තිය, බලශක්තියට සහ අමුද්‍රව්‍යවලට ප්‍රවිෂ්ටය, එයාර් බස් සහ බෝයිං අතර තරගය ආදී අනෙකුත් බොහෝ ප්‍රශ්න මත ද ගැටෙනු ඇත. ජර්මනිය සහ ප්‍රන්සය හා බ්‍රිතාන්‍යය වැනි අනෙකුත් යුරෝපීය බලයන් අතර සබඳතාවන්ට ද එය ම අදාල වේ.

ලෝක-පරිමාන ආර්ථික අර්බුදයේ කොන්දේසි යටතේ වෙලඳපොලවල්, අමුද්‍රව්‍ය සහ ලාභ සඳහා අරගලය නො වැලැක්විය හැකි ලෙස අධිරාජ්‍යවාදී බලයන් අතර ගැටුම් තීව්‍ර කිරීමට ධාවනය වේ. විජිත යුද්ධ බවට වර්ධනය වන වෙලඳ හා ආර්ථික ගැටුම් අවසානයේ වැඩකරන ජනතාවගේ පිටින් යවන අන්තර්-අධිරාජ්‍යවාදී යුද්ධ බවට ගලා යනු ඇත. අන්තර්ජාතික ගැටුම් වර්ධනය වීම සහ කම්කරු පන්තිය මත එල්ල වන තියුනු වන ප්‍රහාර එකම කාසියේ දෙපැත්ත ය.

මෙම ක්‍රියාදාමයේ දී වෘත්තීය සමිති සුවිශේෂී නින්දිත ක්‍රියාකලාපයක් ඉටු කරති. ඕපල් සමාගමේ දී කම්කරු කවුන්සිලය සහ අයිජී මෙටල් වෘත්තීය සමිතිය මැග්නා ගනුදෙනුව ගැන වඩාත් ම හඬින් බෙර වැයුවෝ ය. රැකියා 27,000ක් කපා දමමින් සහ වැටුප් අඩු කරමින් ජීඑම් තම ඇමරිකානු මෙහෙයුම් ප්‍රතිව්‍යුහගත කොට වැඩපොලවල් 14ක් වැසූ විට රුසෙල්හයිම්හි කම්කරු කවුන්සිල් කාර්යාලයෙන් හෝ ෆ්‍රෑන්ක්ෆර්ට්හි අයිජී මෙටල් සමිති මූලස්ථානයෙන් ඇමරිකානු කම්කරුවන්ට සහයෝගීව එකදු වචනයක් හෝ පලකලේ නැත. ඊට වෙනස්ව ඔවුන් කලේ ඇමරිකානු-විරෝධී මනෝගතීන් අවුස්සමින් ඕපල් සමාගමට ජීඑම් වෙතින් වෙන්වීම සඳහා උද්ඝෝෂනය කිරීම සහ මැග්නා සමාගම වෙත වැටුප් කප්පාදු හා රැකියා 11,000ක් අවසන් කිරීමට අවස්ථාව දීමයි.

මැග්නා ගනුදෙනුව අසාර්ථක වීමෙන් පසු කම්කරු කවුන්සිලය ජීඑම් පිටුපස ගොස් ප්‍රතිව්‍යුහගත ඕපල් කලමනාකරනයට සමාගමේ "ප්‍රතිසංවර්ධනයට" සහයෝගය පුදකිරීම හුදෙක් කාලය පිලිබඳ ප්‍රශ්නයක් පමනි. ජීඑම් ප්‍රධාන විධායක නිලධාරී හෙන්ඩර්සන් දැනටමත් ජර්මනියේ ප්‍රවර්ධන සංචාරයක් ආරම්භ කොට ඇත.

රැකියා, වැටුප් සහ සමාජ අයිතිවාසිකම් ආරක්ෂා කරගත හැක්කේ කම්කරුවන් වෘත්තීය සමිති සහ කම්කරු කවුන්සිල්වලින් බිඳී ස්වාධීන ආරක්ෂක කමිටු ගොඩනගා ගතහොත් පමනි. වැටුප් සහ රැකියා ආරක්ෂා කරගැනීම නො වෙන් කල හැකි ලෙස අධිරාජ්‍යවාදයට සහ යුද්ධයට එරෙහි අරගලය සමග බැඳී ඇත. දේශසීමා හරහා එක්සත් විය යුතු කම්කරුවෝ සමාජවාදී ක්‍රියාමාර්ගයක් සමගින් ප්‍රතිමල්ලව ධනේශ්වර කල්ලිවලට එරෙහි විය යුතු ය.

පීටර් ෂ්වාට්ස්